# ලංකාවේ ප්‍රධාන දිය ඇලි



ටැප් එඩුයුටේයින්මන්ට් ප්‍රකාශනයක්

## 1.බඹර කන්ද දිය ඇල්ල



මෙය ලංකාවේ උසම දිය ඇල්ල වන අතර මෙහි උස මීටර් 240 වේ.බදුල්ල දිස්ත්‍රික්කයේ කළුපහන නම් ප්‍රදේශයේ පිහිටා ඇති අතර හෝර්ටන් තැන්නෙන් ආරම්භවන කුඩා ඔය මෙම දිය ඇල්ල නිර්මාණය කරන අතර පසුව වළවේ ගඟට එකතු වේ.

## 2.කුරුළු ඔය දිය ඇල්ල



ශ්‍රී ලංකාවේ දෙවන උසම දිය ඇල්ල වන මෙය මීටර් 188 උසකින් යුක්තය.කුරුළු ඔය දිය ඇල්ල නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර වලපනේ නගරයට ආසන්නව පිහිටා තිබේ.

මෙය කුරුළු ඔයෙන් හට ගන්නා අතර එය මහවැලි ගඟට එකතු වේ.මෙම කුරුළු ඔය දිය ඇල්ල ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

## 3.දියළුම දිය ඇල්ල



මෙය මීටර් 170 යුක්ත දියඇල්ලකි.මෙය බදුල්ල දිස්ත්‍රික්කයේ කොස්ලන්ද ප්‍රදේශයේ පිහිටා තිබේ.මෙය පූනාගල ඔය නිසා ඇතිවී තිබෙන අතර පසුව එය කුඩා ඔයට එකතුවන අතර කුඩාඔය කිරිඳි ඔයේ අතු ගංගාවකි.

## 4.කිරිඳි ඇල්ල




මෙය මීටර් 165 උසකින් යුක්ත වන අතර රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රදේශයේ පිහිටා තිබේ.මෙය කළු ගඟ මගින් ඇතිවන දිය ඇල්ලක් වන අතර එය කුට්ටපිටිය කන්දෙන් කඩා හැලේ.

## 5.රම්බොඩ ඇල්ල

මෙය මීටර් 119 උසකින් යුක්ත වන අතර මෙය නුවරඑළිය දිස්ත්‍රික්කයේ පුස්සැල්ලාව ප්‍රදේශයේ පිහිටා තිබේ.මෙය ඉංගිසි වයි අකුරේ හැඩයට කඩා හැලෙන දිය ඇල්ලක් වන අතර මෙය ජලමුලාශ්‍ර දෙකකින් හට ගන්නා දිය ඇල්ලකි.මෙහි වයි හැඩයේ වම් පස ජලධාරාව පු ඔය වන අතර දකුණු පැත්තේ ජල ධාරාව පුන්ඩළු ඔය වේ.මෙම ජල ධාරාවල් දෙක දෙපැත්තකින් පැමිණ දිය ඇල්ලේ පහල කොටසේදි එක් දිය ඇල්ලක් බවට පත්වේ.

රම්බොඩ ඇල්ල



මෙම ජලධාරාව පසුව කොත්මලේ ඔයට එකතු වන අතර එය මහවැලි ගඟේ අතු ගංගාවකි.

## 6.ලක්ෂපාන දිය ඇල්ල

මෙය මීටර් 114 උසකින් යුක්තය.මෙය නුවරඑළිය දිස්ත්‍රික්කයේ මස්කෙලිය ප්‍රදේශයේ පිහිටා තිබේ.මෙය මස්කෙලිය ඔය නිසා හටගන්නා අතර එය කැළණි ගඟට එකතු වේ.



## 7.රත්න ඇල්ල



මෙය මීටර් 110 උසකින් යුක්ත වේ.මෙය නුවර දිස්ත්‍රික්කයේ හසලක ප්‍රදේශය හරහා ගලා යන හසලක ඔය මගින් ඇති වූ දිය ඇල්ලකි. හසලක ඔය මහවැලි ගඟට එකතු වේ.

## 8.ඇබර්ඩීන් ඇල්ල



මෙය මීටර් 90 උසකින් යුක්ත වන අතර නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගිනිගත්හේන ප්‍රදේශයේ පිහිටා තිබේ.මෙය කෙහෙල්ගමු ඔය නිසා ඇතිවන අතර එය කැළණි ගඟට එකතු වේ.

## 9.ඩේවොන් ඇල්ල



මෙය මීටර් 85 උසකින් යුක්ත වන අතර නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවාකැලේ ප්‍රදේශයේ පිහිටා ඇත.මෙය කොත්මළේ ඔය මගින් හට ගන්නා අතර එය පසුව මහවැලි ගඟට එකතු වේ.

## 10.සෙන්ට් ක්ලේයාර් දිය ඇල්ල

මෙය මීටර් 73 උසකින් යුක්ත වන අතර මෙය පළලින් වැඩි දිය ඇල්ලක් වේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවාකැලේ ආසන්නයේ මෙය පිහිටා ඇත.මෙය කොත්මලේ ඔය මගින් හට ගන්නා අතර එය පසුව මහවැලි ගඟට එකතුවේ.මෙය ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වන අතර මැද ඇති ප්‍රධාන කොටස මහා ඇල්ල ලෙස හඳුන්වන අතර එහි පළල මිටර් 50 පමණ වේ.එයට පහලින් ඇති කොටස කුඩා ඇල්ල ලෙස හඳුන්වයි.

ඉහල කොත්මලේ විදුලි බළාගාරය නිසා මෙය ප්‍රදේශයේ ඇති දිය ඇලි 07 කට බලපෑම් ඇති වු අතර එයින් ඩේවොන් ඇල්ල සෙන්ට් ක්ලේයාර් ඇල්ල පුනාඔය ඇල්ල රම්බෝඩ ඇල්ල පණ්ඩුළු ඔය ඇල්ල ශාන්ත ඇන්ඩෘ ඇල්ල හොලිවුල් ඇල්ල බලපෑමට ලක්විය.



## 11.දුන්හිඳ ඇල්ල

**මෙය මීටර් 57 යුක්ත වන අතර මෙය බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා තිබේ.මෙය බදුලු ඔය මගින් හට ගන්නා අතර බදුලු ඔය මහවැලි ගඟට එකතු වේ.**



එදිනෙදා ජීවිතයට වැදගත් වන පොත් පත් රාශියක් දැන් නොමිලේම ලබාගැනිමට
ටැප් එඩුයුටේයින්මන්ට් ප්‍රකාශන ආයතනයේ නිල වෙබ් අඩවියෙ සියලු පහසුකම් සලසා ඇත.
ඔබට අවශ්‍ය කරන පොත් පත් නොමිලේම ඩවුන්ලෝඩ් කරගන්න පිවිසෙන්න

www.tap.lk

විදුසමය
විද්‍යා සඟරාව

විද්‍යා දැනුම සාමාන්‍යය දැනුම සමග තව බොහෝ වටිනා ලිපි රාශියකින් යුතුව ලංකාවේ පලවන එකම සිංහල විද්‍යුත් විද්‍යා සඟරාව නොමිලේම කියවන්න ඩවුන්ලෝඩ් කරගන්න දැන්ම පිවිසෙන්න විදුසමය විද්‍යා සඟරාවේ නිල වෙබ් අඩවියට

www.Vidusamaya.com